**TRANSLATION**

**උ.ප.රා.සේ.කො.චක්‍ර ලේඛ අංක:** 09 / 2018

මගේ අංකය : **NP/07/10/04/37**
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය.
**23.03.2018**

ලේකම්, කාන්තා කටයුතු අමාත්‍යාංශය,
අධ්‍යක්ෂ, සමාජසේවා දෙපාර්තමේන්තුව,
උතුරු පළාත.

**උතුරු පළාත් රාජ්‍ය සේවයේ සමාජ සේවා නිලධාරී තනතුරේ විශේෂ ශ්‍රේණිය සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම - 2018**

01. උතුරු පළාත් රාජ්‍ය සේවයේ සමාජ සේවා නිලධාරී තනතුර විශේෂ ශ්‍රේණිය සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම් සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති උතුරු පළාත් සමාජ සේවා 1 ශ්‍රේණියේ සේවයට අයත් නිලධාරීන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනය 2018.04.23 වේ.

**02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-**

2. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. අනුමත කරන ලද බඳවා ගැනීම් නීතිරීති අනුව සේවා කොන්දේසි බලපැවැත්වේ.

2.2 මෙම දැන්වීම ප්‍රකාරව අයදුම් කරන ඉල්ලුම්කරුවන්ට උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන ව්‍යුහමය සම්මුඛ පරීක්ෂය මගින් ලබා ගන්නා ලකුණු හා පිළිවෙලින් කුසලතාවය මත හා ප්‍රමුඛතාවය පදනම් කරගෙන බඳවා ගැනීම් කරනු ලැබේ.

2.3 මෙම පත්වීම් ලබා ගන්නා අපේක්ෂකයන් උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානමින් සිටිය යුතු යි.

2.4 ඉහත සඳහන් තනතුරට සමාජ සේවා නිලධාරීන් අයදුම් කරන විට තම අයදුම්පත් තමා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතුයි. දෙපාර්මේන්තු ප්‍රධානියා විසින් නිර්දේශ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03. වැටුප් පරිමාණය :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුව, **(MN-7-2006 A)** යන වැටුප් පන්තියේ **රු.20,030 – 11x365 – 18x500 රුපියල් 33,045-**/වේ. මෙම වැටුප් ක්‍රමයේ 06 වන වැටුප් පියවර වන රුපියල් 21,855/= ආරම්භ වැටුප වේ.

**04. බඳවා ගැනීම සඳහා අවශය මූලික සුදුසුකම් :-**

**4.1 වයස් සීමාව:-**

ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කරගෙන බඳවා ගන්නා විට වයස් සීමාව බලපාන්නේ නැත .

**4.2 සුදුසුකම්:-**

අ.) සමාජ සේවා නිලධාරී තනතුරේ **1** ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) ක අඛණ්ඩ සේවාව හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර අදාළ වැටුප් වර්ධකයන් පහ (05) ද උපයා තිබිය යුතුයි.

ආ. අදාළ කාල පරිච්ඡේදය තුළ, අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වී තිබිය යුතුයි.

**05 සාමාන්‍ය සුදුසුකම් :-**

අයදුම්කරුවන් උක්ත තනතුරේ සේවාවන් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව නිරෝගිමත් විය යුතු අතර උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය නිලධාරියෙකු විය යුතුයි.

**06 බඳවා ගැනීමේ ක්‍රමය:-**

6.1 උතුරු පළාතේ සමාජ සේවා නිලධාරි විශේෂ ශ්‍රේණියට අනුමත බඳවා ගැනීමේ පරිපාටිය, රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ, ආයතන සංග්‍රහය, පළාත් ප්‍රතිපත්තීන් හා නිවේදනයේ **10** වැනි ජේදයේ විධිවිධානයන් ප්‍රකාර බඳවා ගැනීම් සිදු කෙරේ. ඒ සමඟ අයදුම්කරුවන් ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවන අතර මෙම නිවේදනය මගින් ඉල්ලා ඇති සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා හිමි අයිතිවාසිකම් සියල්ල අවලංගු කරනු ලැබේ.

6.2 සමාජ සේවා නිලධාරි විශේෂ ශ්‍රේණියට අනුමත සේවක සංඛ්‍යාවේ තිබෙන පුරප්පාඩු සංඛ්‍යාවන්ට අනුව කුසලතා පදනම මත අනුමත ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණය මගින් උසස් කරනු ලැබේ.

6.3 සියලුම අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් කැඳවන අවසන් දිනය වන 2018.04.23 වන දිනට ප්‍රථම තනතුරට අදාළ සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම අවශ්‍ය වන අතර සුදුසුකම් රහිත අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**07. ව්‍යාජ තොරතුරු සඳහා වන අඩුවම් :-**

අයදුම්පත් සම්පූර්ණ කිරීමේදී අවධානයෙන් යුතුව නිවැරදි තොරතුරු යොමු කළ යුතුයි. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නීතිරීති අනුව කිසියම් අයදුම්කරුවෙකු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ප්‍රථම හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී හෝ පසුව හෝ සුදුසුකම් නැති අයදුම්කරුවකු බවට ඔප්පු වුවහොත් ඔහුගේ අපේක්ෂක හිමිකම වහාම ප්‍රතික්ෂේප වන අතර ඉදිරිපත් කරන කිසියම් තොරතුරක් ව්‍යාජ තොරතුරක් බවට අනාවරණය වුවහොත් එම නිලධාරියා පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ. ඉහත 6.3 ජේදයේ සඳහන් කරුණුවලට අයදුම්කරුවන් තම අවධානය යොමු කළ යුතුයි.

**08. අයදුම් කිරීමේ ක්‍රමය:-**

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුව A4 (සෙ.මී.21x29) ක ප්‍රමාණයෙන් යුත් කඩදාසියේ දෙපැත්ත පමණක් උපයෝගි කර, අංක 01 සිට 11 දක්වා පළමු පිටුවෙත් 12 සිට 13 දක්වා දෙවන පිටුවෙත් ආවරණය වන පරිදි අයදුම්පත් සකස් කර ගත යුතුයි.

8.2 අදාළ ආදර්ශ ඉල්ලුම්පත් වලට අනුකූල නොවන, නිවැරදි ලෙස සම්පූර්ණ කර නැති හා අසම්පූර්ණ අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත ලෙස අයදුම්පත් සම්පූර්ණ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් එමගින් ඇතිවන විපාකවලට වගකිව යුතුයි. අයදුම්පතේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ඵලදායී වන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත් වලට අනුකූලව තිබේ ද යන්න අයදුම්කරු විසින් සහතික කරගත යුතුයි. එසේ නොවන අවස්ථාවලදී ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3 අයදුම්පත් යොමු කරන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ විභාගයේ නම් සඳහන් කළ යුතුයි.

8.4 විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018 අප්‍රේල් මස 23 වන දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැල මගින් **"ලේකම්, උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට යොමු කළ යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

09. අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය සනාථ කිරීමට පහත සඳහන් ලියකියවිලිවලින් එකක් හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

**i.** ජාතික හැඳුනුම්පත.

**ii.** වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. **ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණය :.**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් විෂයන් සම්බන්ධයෙන් ලකුණු ප්‍රදානය කෙරේ. (සම්පූර්ණ ලකුණු ප්‍රමාණය 100 යි )

| **අනු අංකය** | **ලකුණු ලබා දීමේ විෂය පථය** | **උපරිම ලකුණු ප්‍රමාණය** | |
|---|---|---|---|
| **1.** | **ජ්‍යෙෂ්ඨතාවය** | | |
| 1.1 | සමාජ සේවා නිලධාරි 1 ශ්‍රේණියේ උසස්වීමට පසු සෑම වර්ෂයක් සඳහාම අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම නිමිත්තෙන් ලකුණු **පහක්** (05) බැගින් ප්‍රදානය කෙරේ. වසරකට අඩු නමුත් මාස හයකට අධික කාලයට ලකුණු **තුන** (03) බැගින් ප්‍රදානය කෙරේ. මාස හයට අඩු කාල පරිච්ඡේදය සඳහා ලකුණු ප්‍රදානය නොකෙරේ. | ලකුණු 60 | |
| **2.** | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | |
| 2.1 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් සමාජ විද්‍යා / මනෝවිද්‍යාව / සමාජ සේවා/උපදේශනය/ සංවර්ධන පාඨමාලා/ පොදු පරිපාලනය/ සංසණනය යනාදී විෂයන්ගෙන් එක් විෂයකට උපාධියෙන් පසු ඩිප්ලෝමා අධ්‍යනය (Post Graduate Degree) | ලකුණු 15 | ලකුණු 30 |
| 2.2 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/සමාජ සේවා/උපදේශන/ සංවර්ධන පාඨමාලා/ පොදු පරිපාලනය/ සංසණනය යනාදී විෂයන්ගෙන් එකකට උපාධියෙන් පසු ඩිප්ලෝමා | ලකුණු 10 | |
| 2.3 | රජයෙන් අනුමත කරන ලද සමාජ සේවා ආයතනයකින් සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/සමාජ සේවා/උපදේශන/ සංවර්ධන පාඨමාලා/ පොදු පරිපාලනය/ සංසණනය යනාදී විෂයන්ගෙන් එකකට ඩිප්ලෝමා | ලකුණු 05 | |
| **03.** | **පරිගණක හැකියාව** | | |
| 03.1 | ජාතික පුහුණු අධිකාරිය හෝ කාර්මික විද්‍යාලය හෝ ලියා පදිංචි කරන ලද කිසියම් ආයතනයකින් ප්‍රදානය කරන ලද මාස 06 කට නොඅඩු පරිඝණක පාඨමාලා සතුටුදායක ලෙස නිම කර තිබීම | ලකුණු 05 | |
| 04. | **සම්මුඛ පරීක්ෂණ කටයුතු** | | |
| **04.1** | කළමනාකරණ හැකියාව, නායකත්වය, හා භාෂා හැකියාව | ලකුණු 05 | |
| | **එකතුව** | **ලකුණු 100** | |

11. මෙම නිවේදනයේ සඳහන් හෝ සඳහන් නොකරන ලද කරුණුවලින් අදහස් වන හෝ අදහස් නොවන කිසියම් අදහසක් පැහැදිලි නොවන අවස්ථාවක දී ඒ සම්බන්ධයෙන් වෙනස් කිරීමක් අවශ්‍ය වුවහොත් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ගන්නා තීරණය අවසන් තීරණය වේ. එමෙන්ම විශේෂ හේතූන් මත අදාළ ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට නොහැකි අවස්ථාවක් උදා වූ විටෙක ඒ සම්බන්ධයෙන් ද උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් කරන ලද තීරණය අවසන් තීරණය වේ.

12. සේවා අවශ්‍යතාවය පදනම් කරගෙන අදාළ තනතුර සඳහා පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. එම පුරප්පාඩුවලින් කොටසක් සම්පූර්ණ කිරීමට හෝ සම්පූර්ණයෙන් පත්වීම් ලබා දීමේ තීරණය පත්වීම් බලධාරියා සතුය.

**සී. ඒ. මොහන්රාස්**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත
23.03.2018

**පිටපත:** ප්‍රධාන ලේකම්, උතුරු පළාත - දැන ගැනීම සඳහා